2019. 08. 13. මව්බිම පිටුව 5.

# මෙරට 399,784 දෙනෙක් විරැකියාවෙන්

## ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2019 පළමු කාර්තුවේ දත්ත

**බද්දේගම - ඕ. කමලනාථ**

වැඩ කළ හැකි වයසේ පසුවන ජනගහනයෙන් 399,784 දෙනකු රැකියා නොමැතිව සිටින බව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2019 පළමු කාර්තුව අදාළ දත්ත පෙන්වා දෙයි. එහි ප්‍රතිශතය 4.7%කි. ඉන් 208,107 දෙනකු වයස අවුරුදු 15ත් 24ත් අතර පසුවේ. 77,113 දෙනකු වයස අවුරුදු 25ත් 29ත් අතර පසුවන අතර 114,563 දෙනකු වයස අවුරුදු 30 ඉක්ම වූවන්ය.

රැකියා නොකරන 399,784ක පිරිස අධ්‍යාපන තත්ත්වය අනුව වර්ගීකරණයේදී 147,683 දෙනකු අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලැබූවන් වන අතර 91,722ක් අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් වූවන්ය. 160,379 දෙනකු අ.පො.ස. උසස් පෙළ සහ ඊට ඉහළ අධ්‍යාපනය ලැබූවෝ වෙති.